# පොලොන්නරුවේ ගොවීන්ගේ සාමූහික කිරි අලෙවිය

ශ්‍රී ලංකාවේ බතින් සරුසාර වූ ප්‍රදේශ වලින් ප්‍රමුඛ ස්ථානයක් ගන්නා පොළොන්නරු දිස්ත්‍රික්කයේ ගොවියන් හැමවිටම උත්සාහ ගන්නේ තමාගේ එදිනෙද ආහාර අවශ්‍යතාවයන් හැකි තරම් දුරට සිය කුඩා ගොවිපලෙන්ම සපයා ගැනීමටය. ඒ අනුව තමාට අවශ්‍ය සහල්, එළවළු, පළතුරු හා අනෙකුත් ආහාර වර්ග වලට අමතරව සත්ව නිෂ්පාදනයන්, එනම් විශේෂයෙන් එළකිරි හා බිත්තර ආදිය ලබා ගැනීම කෙරෙ හිත් දක්වන්නේ ඉමහත් උනන්දුවකි. මෙම උනන්දුවේ ඈත කාලීන ප්‍රතිඵල දෙස බලන විට එය හොඳින් පැහැදිලි කරවයි.

විශේෂයෙන් 1960 ට පෙර යුගයේදී පවා මේ ප්‍රදේශයේ සෑම ගොවියෙකුටම පාහේ අඩු කරමින් හරකුන් 50–100 ක් අතර ගවයින්ගෙන් හා දෙනුන්ගෙන් යුක්ත ගව පට්ටියක් සිටි බව පැහැදිලිව පෙනේ. නමුත් ඒ යුගය ගත් කල ඇත්තෙන්ම මෙම ගව පට්ටිය එතරම් සංවිධානාත්මක වූ තත්ත්වයක් නම් කොහෙත්ම දකින්න තිබුනේ නැත. එයට හේතු විදියට දක්වන්න පුළුවන් වන්නේ එසේ සිටි ගව දෙනුන්ගෙන් පවා කිරි දෙවන ලද්දේ බොහෝ සෙයින් 10 — 15 ත් අතර ගණනකින් පමණක් වීමත් එසේ දෙවාගත් කිරි වලින් ඉතා සුළු ප්‍රමාණයක් අළුත් කිරි විදියට බීමට ගැනීමත් ඉතිරිය ප්‍රයෝජනයට ගනිමින් එළගිතෙල් නිපදවීමකුත් පමණක් බව ඒ යුගයේ පැවැති තත්ත්වය අනුව දැන්විය හැකිය. නමුත් ඇත්තෙන්ම මෙසේ අසංවිධානාත්මකව සකස් කර ගත් එළගිතෙල් ටික පවා අලෙවි කර ගැනීමට නො හැකිව දැඩි අපහසුතාවයකට එද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඈත ගම් වල ගොවියා පත්ව සිටිබව පෙනේ.

## අලෙවි කරණය

තත්ත්වය එසේ වුවත් 1960 දශකයේ අග භාගය වන විට එවකට පැවැති රජය මෙසේ පැවති තත්ත්වයන් හඳුනාගෙන එයට පිළියමක් යෙදීමේ අරමුණින් ජාතික කිරි මණ්ඩලය පිහිටු වීමත් සමගම, මේ ප්‍රදේශයේ සුළු පරිමාණ කිරි නිෂ්පාදකයින්ට තරමක් හොඳ කාලයක් උදාවිය. එයට හේතු වූයේ කිරි මණ්ඩලය මෙම ගොවියන් නිෂ්පාදනය කරන කිරි ඒවායේ යොදය තත්ත්වය අනුව මිලදී ගැනීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර දීමයි. නමුත් කල්යත්ම කිරි මණ්ඩලයේ මෙම තත්ත්වයන් ටිකෙන් ටික වෙනස් වී සුළු කිරි නිෂ්පාදකයාට නොයෙකුත් අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වන තත්ත්වයකට පත් වුනි. එයට හේතු වූයේ එතෙක් ඈත ගම්වල පැවතුනු ගව පට්ටි වල කිරි නොදෙවා සිටි සියළුම දෙනුන්ගෙන් පැහැදිලි අලෙවි මාර්ගයක් පැවැති නිසා කිරි දෙවීම පටන් ගැනීමත් එහෙයින් ඔවුන්ගේ පට්ටිවල නිපදවන කිරි ප්‍රමාණය ඉහල යාමත් නිසාය. මේ හේතුවෙන් ගොවියනට නරක් නොවන පරිදි ඇසිරීම, ප්‍රවාහනය වැනි අතුරු ප්‍රශ්න රාශියකට ද මුහුණ දෙන්නට සිදුවිය. තත්ත්වය මෙසේ වුවද කල්යත්ම ඈත ගම්මානවල ගොවියනට නගරයේ පිහිටි කිරිමණ්ඩලයේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයට තම නිෂ්පාදන නොයෙකුත් බාහිර අපහසුතා මධ්‍යයේ වුවද අලෙවි කර ගැනීමට හැකිවීමෙන් තම වී, එළවළු හා අනෙකුත් ආහාර භෝග නිෂ්පාදන අලෙවියෙන් ලබන ආදායමට වඩා වැඩි අතිරික්තආදයමක් පහසුවෙන්ම කිරි සැපයීමෙන් ලබා ගැනීමට හැකි විය.

මෙම තත්ත්වය නිසා කිරි මණ්ඩලයට දිනෙන් දින ලැබෙන කිරි ප්‍රමාණය ඉහල යාමත් සමගම නොයෙකුත් ආකාරයේ සංවිධානමය දුෂ්කරතා රාශියකට මුහුණ දීමට සිදුවිය. එක් දිනකට කිරි සැපයුම් කරුවන් විශාල ප්‍රමාණයක් එකම වේලාවක් තුළදී පැමිණීම නිසා කිරිවල යොදය තත්ත්වය පරීක්ෂා කිරීම, කිරි භාර ගැනීම, රිසිට්පත් නිකුත් කිරීම වැනි අමතර කාර්යයන් රාශියක් සඳහා වැඩිපුර සේවක මණ්ඩලයක් යෙදවීමට සිදුවීමේ හේතුවෙන් ඔවුන් නොයෙකුත් ප්‍රායෝගික ප්‍රශ්න රාශියකට මුහුණ දුනි. මේ තත්ත්වය නිසා කිරි මණ්ඩලය ගොවියන්ට සංවිධානයක් වශයෙන් සංවිධාන වී එක්

නියෝජිතයෙක් මගින් පමණක් කිරි සැපයීම කරන ලෙසත් උපදෙස් ලබා දුනි.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තිබුන හිඟුරක්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියත්, පොළොන් නරුව විවිධ සේවා සමුපකාර සමිතියත් සමග සහයෝගයෙන් කටයුතු කර එහි ප්‍රාදේශික මගින් කිරි එකතු කිරීමේ වැඩ පිළිවෙලක් ගොවියන් විසින් සකස් කරන ලදී. නමුත් පසුකාලීනව එහිදී මුදල් ලබා ගැනීමේදීත් විශාල වශයෙන් ගබඩා කිරීමේදීත් නොයෙකුත් අපහසුතා රාශියකට ඔවුන්ට මුහුණ දීමට සිදුවිය. ඇත්තෙන්ම මීට අමතරව මේ යුගය වන විට පශු වෛද්‍ය සේවාව ගමට කොහෙත්ම පැමිණ නොතිබීමේ හේතුවෙන් ගමේ ගොවියන්ගේ ගව පට්ටිවල නොයෙකුත් වසංගත වලදී කිරි දෙනුන් හා අනෙකුත් ගවයින් සිය ගණනින් මිය යාමත් දක්නට පුළුවන් විණ. ඒ නිසා ඇත්තෙන්ම මේ වනවිට ගමේ තිබුන එකම පශු වෛද්‍ය සේවාව වූයේ ගමේ සිංහල වෙදකම පමණයි. එහෙත් එම ක්‍රමය මෙම ගව පට්ටිවල සිටි සතුන්ට ඇතිවුන ලෙඩ රෝග පහසුවෙන් හා ඉක්මණින් වලක්වා ගැනීමට හැකි බටහිර වෛද්‍ය ක්‍රමයට වඩා පහසු ක්‍රමයක් වුනේ නැහැ.

තත්ත්වය එසේ වුවත් සමුපකාර ප්‍රාදේශික මගින් කිරි එකතු කර භාර දීමේ ක්‍රමය තුළත් නොයෙක් අන්දමේ අඩුපාඩු හා දුර්වලතා දක්නට තිබුනි. නියමිත වේලාවට මුදල් ලබා ගැනීමට තිබුන අපහසුතාවය මින් ප්‍රධාන ස්ථානයක් ගනියි. කොහොම වුනත් මෙයට හේතුවී ඇත්තේ ඒ වනවිට සමුපකාර අංශය වැඩි ප්‍රමුඛතාවයක් ලබාදී තිබුනේ මහජනයාගේ කිරි නිෂ්පාදන මිලදී ගැනීමට නොව පාරිභෝගිකයන්ගේ එදිනෙදා අවශ්‍ය වන පාරිභෝගික ද්‍රව්‍ය බෙදහැරීම සඳහාය. මෙම තත්ත්වය නිසා සමුපකාර සංගම් මූලිකවම මුදල් අර්බුද වලට මුහුණ දී තිබුන නිසා කිරි එකතු කිරීමේ කාර්යය සඳහා ඔවුන්ගේ එතරම් කැමැත්තක් දක්නට නොවීය.

තත්ත්වය මෙසේ පවතිද්දී ස්වේච්ඡාවෙන් ගම්වල ගොවීන් 10–15 එකතු වී තම කිරි නිෂ්පාදනයන් එකතු කිරීමටත්, සමුපකාර වලට ගෙනවිත් දීමටත් යන කාර්යයන් සඳහා පමණක් ප්‍රාදේශීය කිරි නිෂ්පාදකයින් නියෝජනය කරමින් කටයුතු කළේය. මෙම ක්‍රමය වුවද අවංකව කටයුතු කරන තාක් කල් හොඳ ක්‍රමයක් වුවද පසුකාලීනව එතරම් හොඳ ක්‍රමයක් නොවන බව ගොවීන්ටම පෙනී ගියෙන් එයත් අඩාල විය.



හෝගවලට පමණක් නොව කිරිවලටද අලෙවිය බලපායි

මෙවන් දහසකුත් එකක් ප්‍රශ්ණ මාලාවකට මුහුණ දී සිටි කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයන් ඒ වනවිට කිරි නිෂ්පාදන අලෙවියෙන් සැලකිය යුතු ආදයමක් ලබමින් සිටි අතරම කිරි වෙළඳපලේ ඔවුන්ගේ නිෂ්පාදන වලට හිමි තැන පිළිබඳවද මනා අවබෝධයක් හා වැටහීමක් ලබාගෙන සිටි බව කිව යුතුය. ඒ නිසා ඔවුන් දිනෙන් දිනම ඔවුන්ට මුහුණ පෑමට සිදු වූ අභියෝගයන් ජය ගැනීම සඳහා පැහැදිලි වූත් ක්‍රියාත්මක වූත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය ගැන ගොවීන් එකිනෙකා අතර සාකච්ඡා කරමින් සිටීම නිසා ඔවුන් තමන්ගේ ප්‍රශ්ණ එවකට සිටි පොළොන්නරුව දිසාපතිවරයාට ඉදිරිපත් කර සාකච්ඡා කරන ලදී.

ඉන්දියාවේ ''අමුල්'' කිරි නිෂ්පාදන සමිති ගැන තිබුනු පැහැදිලි අවබෝධය හා ලංකාවේ පැවැති තත්ත්වය ගැන හොඳින් සිතා බැලීමේ ප්‍රතිඵලයක් වශයෙන් එම සියළු අත්දැකීම් පදනම් කර ගෙන 1978 දී පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිරි නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය ලියාපදිංචි කරන ලද අතර 1979 මාර්තු 02 ද ව්‍යාපාරික කටයුතු ද නිල වශයෙන් ආරම්භ කරන ලදී. මෙහි පාලනය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු කරන අතර ප්‍රාදේශීය සමිතිවල නියෝජිතයන්ගෙන් 5 දෙනෙකු හා සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තුමා පත්කරනු ලබන නියෝජිතයන් 4 දෙනෙකු ගෙන්ද ඊට අමතරව සභාපති හා සාමාන්‍යාධිකාරී වරයෙකු ගෙන්ද යුක්ත වෙයි. මේ අනුව මෙම මව් සංගමය යටතේ ප්‍රාදේශීය වශයෙන් කුඩා පරිමාණ සමිති රාශියක් පිහිටුවා ගන්නා ලදී.

**වීකාශනය**

මෙම කුඩා පරිමාන කිරි නිෂ්පාදන සමුපකාර සමිතියේ අරමුණු අතර පහත සඳහන් පරමාර්ථ ප්‍රමුඛ ස්ථානයක ලා සැලකිය හැක.

1. නිපදවන කිරි අලෙවිකර ගැනීමට පහසුකම් සැලසීම.
2. කිරි වලට සාධාරණ මිලක් ලබාදීම.
3. උසස් වර්ගයේ ගවයන් බෝ කර දීම.
4. දියුණු පශු වෛද්‍ය සේවාවන් ලබාදීම.
5. නවීන ක්‍රම පිළිබඳ දැනුම හා අදල අධ්‍යාපන පහසුකම් නිෂ්පාදකයන්ට ලබා දීම.
6. ගව ආහාර සැපයීම හා තණබිම් සංවර්ධනය.
7. කිරි නිෂ්පාදකයින්ට ගව ආහාර ලබාදීම හා
8. නිෂ්පාදකයන්ට සකසුරුවම් කම හා ඉතිරිකිරීමේ පුරුදු ඇතිකර ගැනීමට උදව් දීම.

මෙසේ පුළුල් අන්දමින් මෙම පරමාර්ථ ඉටු කර ගැනීමේ අදහසින් පිහිටුවා ගන්නා ලද සමිතිය මේ වනවිට වසර 5 පමණ කාලයක සිට නොකඩවා ව්‍යාපාරික කටයුතු කරගෙන ගොස් ඇත. තම සාමාජික කිරි නිෂ්පාදකයින්ට සපයා ඇති පහසුකම් හා උපදෙස් දෙස බැලීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති හෙයින් ඔවුන්ගේ ජීවන තත්ත්වයේ උසස් වීමක් නිතැතින්ම සිදුවී ඇති බව කිව හැකිය. ඒ අනුව දැනට ජාතික කිරි මණ්ඩලය ප්‍රධාන එමෙන්ම ස්ථිර ගැනුම්කරු වශයෙන් තබා ගැනීමට හැකි වී තිබීම පමණක් නොව එහි සාමාජිකයින්ට එතෙක් අලෙවි කර ගැනීමේ අපහසුතා තිබූ කිරි නිෂ්පාදන වලට ස්ථිර වෙළඳපලක් ලබා ගැනීමට හැකිවීම විශේෂයෙන් පැසසිය යුතුය.

තවදුරටත් සලකා බලන කළ මෙම සමිතියේ කටයුතු සඳහා විශේෂ පශු වෛද්‍ය වරයෙක් ලබා ගැනීමෙන් දැනට කිරි නිෂ්පාදකයින්ගේ ගව පට්ටිවල දෙනුන්ට ඇතිවුන ලෙඩ රෝග හා වසංගත බොහෝ දුරට මැඩ පවත්වා නිරෝගීමත් එමෙන්ම ක්‍රමවත් ගව පට්ටියක් පවත්වා ගෙන යාමට හැකිවී ඇත. ඒ අනුව වැඩි කිරි නිෂ්පාදනයක් ගොවීන්ට ලබා ගැනීමට හැකි වී තිබෙන්නේ මේ අන්දමින් දියුණු තාක්ෂණික ශිල්පීය ක්‍රම හා දියුණු පශු වෛද්‍ය ක්‍රම

ඩබ්. ජී. සෝමරත්න,
පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී, අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය.

අනුගමනය කරමින් දියුණු වර්ග වල වැඩි කිරි නිෂ්පාදනයක් ලබා දෙන සතුන් බෝකර තම ගව පට්ටිය වර්ධනය කර ගැනීමෙනි. ඊට අමතරව මෙම සමිතිය මගින් ගොවීන්ට සත්ව පාලනය පිළිබඳව දේශීය හා විදේශීය පුහුණුවීම් ලබා දී ඇති අතර ම මෙම ක්ෂේත්‍රයට අදල චිත්‍රපට, සඟරා, පොත්පත් හා නොයෙකුත් උපදෙස් පත්‍රිකා මගින් ඔවුන්ගේ සත්ව පාලන දැනුම දියුණු කරලීමට අවශ්‍ය පියවරගෙන ඇත. මේ ආකාරයෙන් ඈත ගම්වල සිටි කිරි හරක් පට්ටි හිමියන්ද අද වන විට පිරිසිදු එමෙන්ම වැඩි කිරි ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමේ හැකියාව ලබා ඇත. එහෙයින් මේ අනුව හොඳ වර්ගයේ කිරි සැපයුම මගින් ඔවුන් ලබා ඇති කීර්ති නාමය මොනවට පැහැදිලි වෙයි.

සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරිම සඳහා ගෙන තිබෙන ප්‍රතිපත්ති දෙස බැලීමේදී විශේෂ අවස්ථා සඳහා එනම් උසස් වර්ග වල සතුන් මිලදී ගැනීම, ගවකොටු හා ගවමඩු තනාගැනීම, කිරි ඇසිරීමේ උපකරණ මිලදී ගැනිම, කෘතිම සිංචන කටයුතු සඳහා සහ හදිසි බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා පොලී රහිත ණය මුදල් ලබාදෙන අතරම, රුපියල් 3,000 ක උපරිමයකට යටත්ව 10% අඩු පොලී ප්‍රමාණයක් සහිතව ණය මුදල් සපයා දීමත්ද කෙරේ. මීට අමතරව භාර ගන්නා කිරිවලට ගෙවිය යුතු මුදල් කෙලින් ම අදල සාමාජිකයාගේ බැංකු ගිණුමෙහි තැන්පත් කිරිමේ ප්‍රතිපත්තිය නිසා එතෙක් ඉතිරිකිරීම ගැන කිසිම දැනුමක් නොලත් ගොවීන් ඉතිරිකිරීම හා බැංකු පුරුදු ඇති කරලීම මගින් මාසිකව කිසියම් මුදලක් ඔවුන්ගේ අනාගත අවශ්‍යතා සඳහා ඉතිරි කරන අය බවට පත් වී ඇත.

මෑත කාලයේ කිරි නිෂ්පාදන සමිතියේ කටයුතු දෙස බලන විට එහි දැනට ක්‍රියාකාරී සාමාජිකයන් දහසකට ආසන්න සංඛ්‍යාවක් නොකඩවා දිනපතා කිරි සැපයීම කරනු ලබන අතර ඔවුන්ගෙන් වසරකට කිරි ලීටර් 2,50,000 කට ආසන්න ප්‍රමාණයක් එකතු කර කිරි මණ්ඩලයට ලබා දීමට කටයුතු කර ඇත. මෙසේ කටයුතු කිරීමට හැකි වීමෙන් රටේ පෝෂණ අවශ්‍යතා සපුරා ලීමේ කාර්යයේදී පොලොන්නරුව දිස්ත්‍රික්කයේ නියෝජනය ඉතාමත් ඉහල අගයක් ගන්නා බවද පැවසිය හැකිය. කෙසේ

වුවද සමිතිය මෙම කටයුතු සාර්ථක ව නඩත්තු කිරීම සඳහා 10%ක කොමිස් මුදලක් ලබා ගන්නා අතරම එය ඇත්තටම සමිතිය ලාභයක් ලැබීම පසෙක තබා හුදෙක් සමිතියේ සාමාජිකයන්ට සේවයක් සැලසීමේ අරමුණින් කටයුතු කිරීමක් බවද කියන්න පුළුවන්.

අනෙක් අතට සමිතියේ ක්‍රියාත්මක ප්‍රාග්ධනයේ සහ ස්ථාවර වත්කම්වල වටිනාකම් දෙස බැලීමේදී එහි වර්ධනය පැහැදිලිවම පෙන්වයි. දැනට කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 20ක් හා ඒවායේ ගොඩනැගිලි, තත්ව පාලන උපකරණ, ඇසිරීමේ උපකරණ, ශීතකරණ, හා රෝද දෙකේ ට්‍රැක්ටර් 15ක්, බයිසිකල් හා අනෙකුත් උපකරණ මේ යටතට ගැනේ. මේ අනුව ක්‍රමයෙන් වර්ධනය වන ස්ථාවර වත්කම් ව්‍යුහයක් පවත්නා බවද දැක්විය හැක.

**අනාගත බලාපොරොත්තු :**

මෙහි ඉදිරි බලාපොරොත්තු දෙස බැලීමේදී පැහැදිලිවම එහි සංවර්ධනයටත්, කිරි නිෂ්පාදන සමිතියේ සාමාජිකයන්ගේ ජීවන තත්ත්වයන්හි වර්ධනයටත් බෙහෙවින් බලපාන ක්‍රමවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර ඇත. ඒ අනුව තවදුරටත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඈත ගම්වල නිෂ්පාදනය කරනු ලබන කිරි එකතු කිරීම සඳහා නව එකතු කිරීමේ මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීමටත්, කිරි වලින් නිෂ්පාදනය කල හැකි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත රාශියක් ඇති කිරීමටත් අපේක්ෂා කරයි. ඒ අනුව මුදවාපු කිරි, බටර්, යෝගට් හා කල් තබා ගත හැකි කිරි නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා දැනටමත් රුපියල් 60,000 ක් වටිනා ශීත කරණයක් ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාරය මගින් ලබා දී ඇත.

මෑත කාලයේ මෙම කිරි නිෂ්පාදනය සමුපකාර සමිතියේ ප්‍රගතිය දෙස බැලීමේදී ඊට බලපෑ හේතු කිහිපයක් පැහැදිලිවම දැක්විය හැක ඒ අනුව මෙම සංවිධානය ආරම්භයේදී පටන් එහි නායකත්වය අවංක එමෙන්ම ශක්තිමත් තීරණ ගත හැකි නායකත්වයක් වටා එක්වී තිබීම පැහැදිලිවම පෙනේ. එමෙන්ම සංවිධානයක් වශයෙන් එකතු වීමෙන් තනි තනිව ගන්නා ලද තීරණ වලට වඩා හොඳ තීරණ ගැනීමට හැකිවීමෙන් පැහැදිලි වෙළඳ පලක් හා හොඳ මිල ගණන් ලබාගැනීමට හැකි වී තිබීමත්, සංවිධානය වුනාට පසු එතෙක් පැවැති සියළුම දුර්වලතා හා අලාභ බොහෝ දුරට අඩුකර ගැනීමට හැකිවීමත් එහි වර්ධනය මොනවට පැහැදිලි කරවයි. එමෙන්ම රජයේ අනුග්‍රහය ලැබෙන හා ඔවුන්ගේ උපදෙස් ආදිය ලැබීමද සංවර්ධනයේදී මෙම සුළු ගොවි සංවිධානයට ඉමහත් රුකුලක් වී ඇත.

තවදුරටත් සලකා බලන කල ජාතික කිරිමණ්ඩලය සහ ගොවියන් අතර සම්බන්ධීකරණ ආයතනය ලෙස පැහැදිලිවම කරන කාර්යයන් තුලින් ගොවීන්ට හොඳ නිෂ්පාදනයක් වෙළඳ පලට ඉදිරිපත් කිරීමටත්, වෙළඳ පලට අවශ්‍යවන පරිදි භාණ්ඩය නිෂ්පාදනය කිරීමටත් ගන්නා උත්සාහය පැසසිය යුතුය. ඒ අනුව අවසානයේ සුළු ගොවියාගේ ජීවන තත්ත්වයෙහි උසස් වීමක් නිරන්තරයෙන ලබා දෙන අතරම රටේ සංවර්ධනයේදී ද කිසියම් දයකත්වයක් පෝෂණ පදර්ථ වෙළඳපලට ලබා දීම මගින් ඔවුන් නිතැතින්ම ලබා ගන්නා බව කිව හැක.

